# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


05/11/2013

## මාධ්‍ය නිවේදනයයි

වින්නඹු මාතාවන්ගේ සේවය වසර 1883 දි නූතන සෞඛ්‍ය සේවය තුල ස්ථාපිත වු සෞඛ්‍ය සේවය තුල බැබළුණු වෘත්තියවේදීන්ගේ ගෞරවයට පාත්‍ර වූ තාක්ෂණික සේවයකි. 1920 දි පමණ හෙද සේවය ඇරඹිණි. හෙද හා වින්නඹු සේවා වෙනස් අරමුණු ඉටු කිරීමට ඇති වූ එකිනෙකට වෙනස් තාක්ෂණික සේවාවන් දෙකකි.

ශ්‍රී ලංකාවේ භෞතික සෞඛ්‍ය දර්ශක ලොව දියුණු රටවල හා සමව ඉහලින් ඇත. ළදරු මරණ හා මාතෘ මරණ අඩු අගයක පවත්වා ගනිමින් ප්‍රශස්ත සූතිකාගාර සේවයක් පවත්වාගෙන යාමට මනා පුහුණුවක් ලැබූ වින්නඹු මාතාවන්ගෙන් ලැබෙන දායකත්වය ඉමහත්ය.

වෘත්තිය සමිති දේශපාලනය අයුතු ලෙස යොදා ගනිමින් හෙද හෙදියන් වින්නඹු මාතාවන්ගේ සේවය (පවුල් සෞඛ්‍ය සේවය) ආක්‍රමණය කරමින් සිටී. අද වන විට ප්‍රධාන රෝහල් තුලද සූතිකාගාර වලින් පවුල් සෞඛ්‍ය සේවිකාවන් පන්නා දමා ඇත. ඔවුන්ගේ මීලග ඉලක්කය ප්‍රජා සෞඛ්‍ය සේවයයි.

පවුල් සෞඛ්‍ය සේවිකාවකට මෙන් දෙගුණයක මුදලක් සූතිකාාර පුහුණුව ලත් හෙදියකට පුහුණු දීමනා ලෙස පමණක් රජය ගෙවයි. එම මුදලින් අඩක් වියදම් කර වින්නඹු මාතාවන් පුහුණු කල හැකි වුවත් එම සේවයම ලබා ගැනිමට හෙදියන්ට අමතර පුහුණුවක් ලබා දිම මහජන මුදල් නාස්තියක් වේ.

හෙද සංගම් කියන්නේ උග්‍ර හෙද හිඟයක් ඇති බවයි. හෙද හෙදියන් අවශ්‍ය වන ප්‍රමාණය සම්පූර්ණ වන දිනයක් අසන්නට නැත. රටපුරා රෝහල්වල හෙද හෙදි හිඟය නිසා වැසී ඇති දැඩි සත්කාර ඒකක ඇතුළු ස්ථාන විශාල සංඛ්‍යාවක් මෙම හෙද හෙදියන් යොදා ගන්නේ නම් අද හෙටම විවෘත කර හැක. උදාහරණයක් ලෙස අනුරාධපුර මහ රෝහලේ සමහර ශල්‍යාගාර, දැඩි සත්කාර ඒකක හෙද හිඟයෙන් වැසී ඇත.

තමන්ට අදාල පුහුණුව ලැබූ හෙද කම නොකොට වෙනත් සේවා ආක්‍රමණය කිරීමෙන් රටේ සෞඛ්‍ය සේවාවේ බරපතල සේවා අර්බුදයක් ඇති වී තිබේ. මාතෘ හා ළදරු සෞඛ්‍ය සේවා මින් අනතුරට පත්වේ. මෙසේ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා පිරිහිමට අඩිතාලම් වැටෙමින් පවති. සෞඛ්‍ය ඇමතිතුමා ඇතුළු වගකිව යුතු නිලධාරින් මේ අවස්ථාවේදි සෘජු තිරණ ගෙන සෞඛ්‍ය සේවා පිරිහිම නැවැත්විය යුතුය. වසර 7ක් නවතා ඇති පවුල් සෞඛ්‍ය සේවා පුහුණුව සඳහා බඳවා ගැනිම වහාම ඇරඹිය යුතුය. ඊට අවැසි පූර්ණ දැයකත්වය ලබා දිමට රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය සැමවිටම සූදානමින් සිටී.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

| | | | |
|---|---|---|---|
| වැඩිදුර විස්තර - | වෛද්‍ය නවීන් සොයිසා | - | 0718582444 |
| | වෛද්‍ය පරාක්‍රම වර්ණසූරිය | - | 0717357152 |
| | වෛද්‍ය සාරද කන්නන්ගර | - | 0773810794 |